සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) බෝසතාණන් තම අවසන් උපත සඳහා නුවණින් විමසා බැලීම හඳුන්වන්නේ,
(1) අභියෝග ජයගැනීම ලෙස ය. (2) පංචමහා විලෝකනය ලෙස ය.
(3) සත්‍ය සොයා යාම ලෙස ය. (4) අධිෂ්ඨානය ලෙස ය.

(02) සක්විති රජ වුව ද සසරේ ඉපදී ජාති, ජරා, ව්‍යාධි හා මරණවලට ගොදුරුවීම බුදුදහමේ හැඳින්වෙන්නේ,
(1) අටලෝදහම ලෙස ය. (2) සැප දුක ලෙස ය.
(3) ත්‍රිලක්ෂණය ලෙස ය. (4) භව තණ්හා ලෙස ය.

(03) මහා සංඝරත්නයට පැවරී තිබෙන සමාජ නායකත්වයට අදාළව උන්වහන්සේලාගෙන් ඉටුවන සේවාවක් වන්නේ,
(1) ආහාර නිවාස ආදී මූලික අවශ්‍යතා ලබාදීමයි.
(2) කෙලෙස් මුලිනුපුටා දැමීමට භාවනා කිරීමයි.
(3) ගිහියා මිත්‍යාවෙන් මුදවා සත්‍යයට යොමු කිරීමයි.
(4) මහා සංඝරත්නය සාමූහිකව වතාවත් ඉටු කිරීමයි.

(04) තමා විසින් ම සිරි සදහම් පිළිපැද ඇස් පනාපිට මෙලොවදී ම තමාට ප්‍රතිඵල අත්විඳිය හැකි බැවින් ධර්ම රත්නය,
(1) අකාලික නම් වේ. (2) සන්දිට්ඨික නම් වේ.
(3) ඒහි පස්සික නම් වේ. (4) ඕපනයික නම් වේ.

(05) ශීලයෙන් යුතුව සමාධි භාවනාවේ යෙදීමේ දී පුද්ගලයකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) අන්‍යමත ගරු කිරීම ය. (2) බලයෙන් යුතු වීම ය.
(3) ලද දෙයින් සතුටු වීම ය. (4) සමාජශීලී වීම ය.

(06) යමෙක් තුළ උදාසීනකම පවතීනම් පාඩම් කළ දෙය මතකයට නොනැගේ. ඒ නිදිබර බව බුදුදහමට අනුව,
(1) ථිනමිද්ධ වේ. (2) ව්‍යාපාද වේ.
(3) කාමච්ඡන්ද වේ. (4) විචිකිච්ඡාව වේ.

(07) මුණිගුණාලංකාරය, සාරාර්ථ සංග්‍රහය වැනි ශාස්ත්‍රීය ග්‍රන්ථ ලියූ බෞද්ධ භික්ෂූන් වහන්සේනමක් වූයේ,

(1) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ ය.

(2) වීදාගම මෛත්‍රෙය හිමියන් ය.

(3) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ය.

(4) රේරුකානේ ඡන්ද විමල හිමියන් ය.

(08) නිවන ආවරණය කරන ධර්ම පහක් බුදුදහමේ හැඳින්වේ. ඒවා නම්,

(1) පංච උපාදානස්කන්ධයයි. (2) පංච බල ධර්මයයි.

(3) පංච නීවරණ ධර්මයයි. (4) පංච නියාම ධර්මයයි.

(09) යමෙක් තරුණ වියේ දී ධනය රැස් නොකර මහලු වියේ දී පසුතැවිලිවන්නේ නම් ඊට හේතුව,

(1) උට්ඨානය නොමැතිවීමයි. (2) ශ්‍රද්ධාව නොමැතිවීමයි.

(3) දැඩි ලෝභයක් ඇතිවීමයි. (4) ලද දෙයින් සතුටු නොවීමයි.

(10) අපගේ එදිනෙදා ජීවිතයේ ඕනෑම ගැටළුවක් විසඳාගැනීම සඳහා ද භාවිත කළ හැක්කේ,

(1) ආත්මවාදී න්‍යායයි. (2) ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායයි.

(3) භෞතිකවාදී න්‍යායයි. (4) පුබ්බේකතහේතුවාදී න්‍යායයි.

(11) බුදුදහම අනුව මිනිසුන්ගේ සචේතනික ක්‍රියාවන් ක්‍රියාත්මක වන දොරටු තුනක් වේ. එමදොරටු තුනෙන් ම සිදුවිය හැක්කේ,

(1) කායකම්ම ය. (2) කුසල කම්ම ය.

(3) වචී කම්ම ය. (4) මනෝ කම්ම ය.

(12) කරදර බාධකවලට මුහුණ දෙනවිට සියල්ල කර්මයට පවරා නොදී ප්‍රඥාව, අධිෂ්ඨානය, උත්සාහය පෙරදැරිකොට ජීවිත අභියෝග ජයගැනීම,

(1) කාල සම්පත්තිය වේ. (2) උපධි සම්පත්තිය වේ.

(3) ගති සම්පත්තිය වේ. (4) ප්‍රයෝග සම්පත්තිය වේ.

(13) වෙනත් කර්මයකින් වළකාලිය නොහැකි ශක්තිමත් බලසම්පන්න කර්ම,

(1) ගරුක කර්ම වේ. (2) ආසන්න කර්ම වේ.

(3) ආචිණ්ණ කර්ම වේ. (4) කටත්තා කර්ම වේ.

(14) වෙනත් ආගම්වලට ගරු කිරීමත් ආගමික සිද්ධස්ථාන ආරක්ෂාකර දීමත් බෞද්ධයන් වන අපගේ වගකීම වේ. මේ අනුව වෙනත් ආගම්වලට ගරුකිරීම යනු,

(1) අන්තර් සාමයික සහජීවනයෙන් කටයුතු කිරීමයි.

(2) කරුණා සහගතව කටයුතු කිරීමයි.

(3) පංච ශීලයෙන් යුතුව ජීවත්වීමයි.

(4) සම්මා ආජීවයෙන් යුතු වීමයි.

(15) ස්වාභාවික විපතක් සිදුවූ අවස්ථාවේ දී ජාති ආගම් භේදවලින් තොරව ජනතාව කටයුතු කරන අයුරු අප කොතෙකුත් දැක ඇත. මෙය බුදුදහමට අනුව,

(1) දනුමෙන් කටයුතු කිරීමයි. (2) සමානාත්මතාවෙන් කටයුතු කිරීමයි.

(3) මුදිතාවෙන් කටයුතු කිරීමයි. (4) උපේක්ෂාවෙන් කටයුතු කිරීමයි.

(16) ''බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතය'' පිළිබඳව පැහැදිලි කරමින් දේශනා කරන ලද සූත්‍රය වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍රයයි. (2) මංගල සූත්‍රයයි.
(3) ද්‍රෝණ සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

(17) අඹුසැමි සබඳතා බිඳ නොවැටී පවුල් සංස්ථාව අර්බුදයකට යාම වළක්වා ගැනීමට නම්,
(1) සැමියාට නිතර ම මුල්තැන දිය යුතු ය.
(2) පරදාර සේවනයේ නොයෙදිය යුතු ය.
(3) නීති අනුව පවුල පාලනය කළ යුතු ය.
(4) නව තාක්ෂණයට මුල් තැන දිය යුතු ය.

(18) සිගාලෝවාද සූත්‍රය අනුව ශිෂ්‍යයන් විසින් ගුරුවරුන්ට ඉටුකළ යුතු යුතුකමක් වන්නේ,
(1) තම මිත්‍රයන්ට හඳුන්වා දීමයි. (2) පාසලේ වගකීම් පවරා දීමයි.
(3) කුල පරපුර ආරක්ෂාකර දීමයි. (4) මැනවින් ශිල්ප ඉගෙන ගැනීමයි.

(19) අන් අයගේ ජීවිතය උදුරාගත් පුද්ගලයා සිය ජීවිතය කවර මොහොතක අහිමිවේදැයි බියෙන් පසුවෙයි. නමුත් ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹිය හැක්කේ,
(1) භාවනා කිරීමෙනි. (2) සිල් රැකීමෙනි.
(3) කරුණාව දැක්වීමෙනි. (4) උපේක්ෂාවෙනි.

(20) තමන් උපමා කොට අනුන් ගැන සිතීම
(1) අත්තූපනායික ධර්මය වේ. (2) අටලෝදහම වේ.
(3) ත්‍රිලක්ෂණය වේ. (4) සල්ලේඛ ප්‍රතිපදාව වේ.

(21) ත්‍රිවිධ රත්නය පිළිබඳව මනා අවබෝධයකින් ඇති කර ගන්නා පැහැදීම,
(1) භක්තිය නම් වේ. (2) ශ්‍රද්ධාව නම් වේ. (3) ශීලය නම් වේ. (4) ඇදහීම නම් වේ.

(22) ''මම ය, මගේ ය, මගේ ආත්මය ය, මා තුළ විනාශ නොවන හරයක් ඇත.'' යනා දී යුධ ගැටුම් කලකෝලාහල ඇතිවීමට හේතුවන වැරදි මතය වෙනුවට බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කොට වදාළේ,
(1) අනාත්ම වාදයයි. (2) කර්ම වාදයයි.
(3) භෞතික වාදයයි. (4) සාස්වත වාදයයි.

(23) සමාජ ගැටලු ඇතිවන ආකාරය හා ඒවා විසඳාගත හැකි ආකාරය පෙන්වා දෙනු ලබන බෞද්ධ ඉගැන්වීම වන්නේ,
(1) කර්මයයි. (2) පටිච්ච සමුප්පාදයයි. (3) ශීලයයි. (4) සතර අගතියයි.

(24) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ශීල ශික්ෂාවට අයත් අංගයක් වන්නේ,
(1) ''සම්මා සතිය'' යන්නයි. (2) ''සම්මා දිට්ඨිය'' යන්නයි.
(3) ''සම්මා ආජීව'' යන්නයි. (4) ''සම්මා වායාම'' යන්නයි.

(25) බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන්ට දේශනා කළ දම්සක් පැවතුම් සූත්‍රයේ අඩංගුවන ධර්ම කරුණ වූයේ,
(1) පටිච්ච සමුප්පාදයයි. (2) කර්මයයි.
(3) චතුරාර්ය සත්‍යයයි. (4) නියාම ධර්මයි.

(26) බුදුරජාණන් වහන්සේ දෙවන, තෙවන හා සිව්වන වස්කාලයන් ගත කළේ,
(1) ජේතවනාරාමයේ ය. (2) වේළුවනාරාමයේ ය.
(3) චාලිය පර්වතයෙහි ය. (4) නිග්‍රෝධාරාමයේ ය.

(27) පුද්ගලයා ඉපයූ වස්තුව විනාශ වන දොරටු හයට ඇතුළත් **නොවන** කරුණ වන්නේ,
(1) මත්පැන් පානය යන්නයි. (2) පාපමිත්‍ර ඇසුර යන්නයි.
(3) සූදුවට ලොල්වීම යන්නයි. (4) බොරුකීම යන්නයි.

(28) බුදුරජාණන් වහන්සේ වෛද්‍යවරයකු බව පෙළදහමේ සඳහන් වේ. ඒ අනුව "සත්හට වන බව දුකට වෙදාණන්" යන කවිය අඩංගු ග්‍රන්ථය වන්නේ,
(1) ලෝවැඩ සඟරාවයි. (2) සුභාෂිතයයි.
(3) කව්සිළුමිණයි. (4) ගුත්තිල කාව්‍යයයි.

(29) රෝග වැළඳීමට හේතුවන කරුණු අටක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එම කරුණු අයත් බෞද්ධ සූත්‍රය වන්නේ,
(1) අරියපර්යේෂණ සූත්‍රයයි. (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
(3) ගිරිමානන්ද සූත්‍රයයි. (4) වසල සූත්‍රයයි.

(30) අනුභව කළ ආහාර වමාරා දමා නැවතත් ආහාර ගන්නා තරමට කෑමට ගිජු වූ තැනැත්තා ධර්මයට අනුව හැඳින්වෙන්නේ,
(1) කාකමාසක ලෙස ය. (2) භුත්තවමිතක ලෙස ය.
(3) තත්ථාවට්ටක ලෙස ය. (4) අලංසාටක ලෙස ය.

(31) ප්‍රධාන වශයෙන් ස්තූප සය ආකාර වේ. ඒ අනුව ඝණ්ටාකාර ස්තූපයක්,
(1) සීනුවක හැඩයෙන් යුක්ත ය. (2) කළයක හැඩයෙන් යුක්ත ය.
(3) දිය බුබුලක හැඩයෙන් යුක්ත ය. (4) නෙල්ලි ගෙඩියක හැඩයෙන් යුක්ත ය.

(32) අනුරාධපුර යුගයට අයත් චිත්‍ර වන්නේ,
(1) තිවංක පිළිමගෙයි චිත්‍ර ය. (2) හිඳගල චිත්‍ර ය.
(3) දිඹුලාගල ලෙන් චිත්‍ර ය. (4) කැළණි විහාරයේ චිත්‍ර ය.

(33) ගුරුළුගෝමී පඬිතුමා විසින් රචිත අමාවතුර ග්‍රන්ථය අයත් වන්නේ,
(1) පොළොන්නරු යුගයට ය. (2) අනුරාධපුර යුගයට ය.
(3) දඹදෙණි යුගයට ය. (4) කෝට්ටේ යුගට ය.

(34) මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලී ග්‍රන්ථයේ සඳහන් වන්නේ බුදුරජාණන් වහන්සේගේ,
(1) සත්ථාදේව මනුස්සානං ගුණයයි. (2) අරහං ගුණයයි.
(3) සම්මා සම්බුද්ධ ගුණයයි. (4) සුගත ගුණයයි.

(35) බුදු දහමට අනුව මනුෂ්‍යයා සැකසී ඇත්තේ ස්කන්ධ පහකිනි. එම පංචස්කන්ධය,
(1) චක්ඛු, සෝත, ඝාන, ජිව්හා, කාය නම් වේ.
(2) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර සහ විඤ්ඤාණ නම් වේ.
(3) පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආකාස නම් වේ.
(4) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නම් වේ.

(36) සංසාර සාගරයෙන් එතෙර වීම සඳහා බුදුරජාණන් වහන්සේ වදාළ මග ට පිවිසෙන දොරටුවේ පළමුවැන්න,

(1) කර්මය වේ. (2) ප්‍රඥාව වේ. (3) ශ්‍රද්ධාව වේ. (4) සමාධිය වේ.

(37) තමන්ගේ කම, නෑදෑකම, හිතවත්කම, පාක්ෂිකභාවය ආදිය නිසා රජතුමා යම් අගතිගාමී ක්‍රියාවක් කරන්නේ නම් එය,

(1) ඡන්දයයි. (2) ද්වේෂයයි. (3) මෝහයයි. (4) භයයි.

(38) බුද්ධකාලීන භාරතයේ සමූහ ආණ්ඩු පාලනය නියෝජනය කළේ,

(1) වජ්ජීන් ය. (2) කොසොල් රජ ය. (3) උදේනි රජ ය. (4) බිම්බිසාර රජ ය.

(39) සතර සංග්‍රහ වස්තුන්ට අයත් **නොවන්නේ,**

(1) දානයයි. (2) ප්‍රිය වචනයයි. (3) අර්ථ චර්යාවයි. (4) ශීලයයි.

(40) බුදුදහම පෙන්වා දෙන ''පටිසෝතගාමී පිළිවෙත් අනුව කටයුතු කරන්නෝ,

(1) සැප සෙවීමෙහි ම උනන්දු වෙති.

(2) දුරාචාර දනන් අතර සදාචාරවත්ව වෙසෙති.

(3) යුද්ධයට යුද්ධයෙන් ම ප්‍රතිචාර දක්වති.

(4) රාගාදී කෙලෙස් නිසා උන්මාද වෙති.

(ලකුණු 40 x 01 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. ලකුණු 20කි.
- 2 සිට 7 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරක් ද තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය. එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් හිමිවේ.

---

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) සිදුහත් කුමරු හැදෑරූ ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න.

(ii) බෞද්ධයන් විසින් සංඝරත්නයේ ආශිර්වාදය ලබාගන්නා සුවිශේෂී අවස්ථා දෙකක් ලියන්න.

(iii) සංඝ රත්නයේ ගුණ දෙකක් නම් කරන්න.

(iv) "විසේසේන පස්සතීති විපස්සනා" යන්නෙහි තේරුම ලියන්න.

(v) දුටුගැමුණු රජතුමා විසින් තැනවූ බෞද්ධ සිද්ධස්ථාන දෙකක් නම් කරන්න.

(vi) පුද්ගලයකුගේ යසස වැඩෙන කරුණු දෙකක් සඳහන් කරන්න.

(vii) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස දෙකක් නම් කරන්න.

(viii) සිගාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන් අයත්වන දිසාව කුමක් ද?

(ix) බැමිණිතියා නම් සාගතය ලංකාවේ ඇතිවූයේ කිනම් රජුගේ රාජ්‍ය සමයේ ද?

(x) අනුරපුර මහමෙවුනා උයනේ වැඩසිටින බුද්ධ ප්‍රතිමා වහන්සේගේ ආසනය හා මුද්‍රාව නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) බුදුදහම අනුව 'සීලය' යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ශීල ශික්ෂාවට අයත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග තුන දක්වන්න. (ලකුණු 03)

(iii) වර්තමාන සමාජයේ විවිධ අපචාරයන් වළක්වා ගැනීම සඳහා ශීලයෙන් ලැබෙන පිටුවහල කවරේ ද? (ලකුණු 05)

(03) (i) බුදු දහමේ හැඳින්වෙන කර්මය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) දස අකුසල් අතරින් මනෝ කර්මයට අයත් අංග තුන කවරේ ද? (ලකුණු 03)

(iii) අකුසලයෙන් වැලකී කුසලයෙහි යෙදීමෙන් දෙලොවම සාර්ථක කර ගත හැකි ය. මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 05)

(04) (i) වෙනත් කිසිදු උපතක දක්නට නොලැබෙන, බෝසත් උපතේ පමණක් දක්නට ලැබෙන ආශ්චර්යවත් සිදුවීම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සිදුහත් කුමරුගේ ළමා අවධියේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) කැපවීම, අධිෂ්ඨානය හා නිවැරදි ගමන් මඟ යාම තුළින් ශිෂ්‍ය ජීවිතයේ අභියෝග ජයගත හැකි අයුරු පහදන්න. (ලකුණු 05)

(05) (i) ධර්ම සංගායනාවක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) සිව්වන ථේරවාදී ධර්ම සංගායනාව පැවැත්වීමට හේතුවූ කරුණු තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) පාසලක් තුළ ඇතිවන ඕනෑම ගැටලුවක දී සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් ලබාගැනීමේ ඇති වැදගත්කම කවරේ ද? (ලකුණු 05)

(06) බෝසත් චරිතය හා සම්බන්ධ වැදගත් සිදුවීම්වලට පසුබිම වූයේ නිහඬ සොඳුරු පරිසරයයි.

(i) එවැනි අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩප බවට පත්කළ අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) අප අවට ඇති පරිසරය සුරක්ෂිත කිරීමෙන් සමාජයට වන යහපත කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) පහත ඒවායින් මාතෘකා **දෙකකට පමණක්** කෙටි සටහන් ලියන්න.

(i) සඳකඩ පහණ (ලකුණු 05)

(ii) දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය (ලකුණු 05)

(iii) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමි (ලකුණු 05)

(iv) නිරෝගීකම උතුම්ම ලාභයයි. (ලකුණු 05)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம் மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province Department of Education - Western Province

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

## පිළිතුරු පත්‍රය
## Marking Scheme

ශ්‍රේණිය / தரம் / Grade: 10
විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය
පත්‍රය / வினாத்தாள் / Paper: I,II

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 2 | (21) | 2 | (31) | 1 |
| (02) | 3 | (12) | 4 | (22) | 1 | (32) | 2 |
| (03) | 3 | (13) | 1 | (23) | 2 | (33) | 1 |
| (04) | 2 | (14) | 1 | (24) | 3 | (34) | 2 |
| (05) | 3 | (15) | 2 | (25) | 3 | (35) | 2 |
| (06) | 1 | (16) | 3 | (26) | 2 | (36) | 3 |
| (07) | 1 | (17) | 2 | (27) | 4 | (37) | 1 |
| (08) | 3 | (18) | 4 | (28) | 1 | (38) | 1 |
| (09) | 1 | (19) | 2 | (29) | 3 | (39) | 4 |
| (10) | 2 | (20) | 1 | (30) | 2 | (40) | 2 |

(ලකුණු 01 x 40 = 40)

## II පත්‍රය

(01) (i) කඩු ශිල්ප, දුනු ශිල්ප, ඇත් අසුන් හැසිරවීම
(ii) ජන්ම දින සැමරුම, නම් තැබීම, ඉඳුල් කටගෑම
(iii) 17 පිටුව
(iv) නුවණින් විශේෂ කොට බැලීමයි.
(v) 37 පිටුව බලන්න.
(vi) 43 පිටුව බලන්න.
(vii) පෙළ පොතේ 45 පිටුව
(viii) උඩ දිශාව
(ix) වළගම්බා රාජ්‍ය සමය
(x) වීරාසන හා ධ්‍යාන මුද්‍රාව

(ලකුණු 02 x 10 = 20)

(02) (i) කය වචනය සංවර කර ගැනීමයි. (ලකුණු 02)

(ii) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව (ලකුණු 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(03) (i) සිතා මතා කරනු ලබන ක්‍රියා කර්ම නම් වේ. (ලකුණු 02)

(ii) අභිධ්‍යාව, ව්‍යාපාද, මිත්‍යා දෘෂ්ඨිය (ලකුණු 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(04) (i) සත් පියුම් පිපීම, සිංහනාද පැවැත්වීම, පියවර තැබීම (ලකුණු 02)

(ii) "කීකරු බව, කාරුණික බව, උගන්වන දේ ධාරණය කර ගැනීම (ලකුණු 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(05) (i) බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක්ව සජ්ඣායනය කිරීමයි. (ලකුණු 02)

(ii) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
- ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ ශාසනික පිළිවෙත් පිරිහී යාම
- ග්‍රන්ථ ධූර වැඩූ භික්ෂූන්ට වඩා විදර්ශනා වැඩූ භික්ෂූන් වහන්සේලා ප්‍රබල වීම, ග්‍රන්ථ ධූරය වැඩීම සඳහා ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීම
- ධර්මය ඉගැන්වීමට. ඇසීමට, පර්යේෂණය කිරීමට ඇතමුන් තුළ ඇති උනන්දුව

(ලකුණු 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(06) (i)
- බුදු බව ලැබීමට පෙර දින හඳ වනයේ දී දිවා විහරණය ගත කිරීම
- අභිනිෂ්ක්‍රමණයෙන් පසුව වනගතව ආර්යපර්යේෂණයෙහි යෙදීම
- බුදු වූ පසු ඇසතු බෝ රුක දෙස සතියක් ඇසිපිය නොහෙලා බලා සිටීම ආදී ලෙස (ලකුණු 02)

(ii) 10 ශ්‍රේණිය පෙළපොත 90 පිටුව (ලකුණු 03)

(iii) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 05)

(07) එක් මාතෘකාවකට ලකුණු 5 බැගින් ලකුණු 10ක් පිරිනමන්න.